## CII – 02

## ශ්‍රී ලංකාවේ රාජ්‍ය නිලබල ව්‍යූහය සංවර්ධන වගකීම් වලට ගැලපෙන ලෙස සකස් කිරීම (මහනුවර ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා එහි සේවා සම්පාදනය ආශ්‍රයෙන්)

**අ. ගොඩගම**

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්ව විද්‍යාලය

ශ්‍රී ලංකාවේ නිලබල ක්‍රමයේ ආරම්භය යටත් විජිත යුගයේ ප්‍රතිඵලයකි. 1948 දී ශ්‍රී ලංකාව නිදහස ලබා ස්වාධීන රාජ්‍යයක් බවට පත්වීමෙන් පසු සංවර්ධන අභියෝග බාරගනී. මෙහිදී නිලබල ක්‍රමය සංවර්ධන අරමුණු වලට ගැලපෙන ලෙස සකස් කිරීමේ අවශ්‍යතාවය පැනනගී. මේ දක්වා නොයෙක් ප්‍රතිසංස්කරණ ඇති කල ද ඒවායේ දූර්වලතා පැවැතිණි. මේ අනුව අධ්‍යයන ගැටළුව බවට පත්ව ඇත්තේ ශ්‍රී ලංකාවේ නිලබල ක්‍රමය හා රාජ්‍ය සංවර්ධන වගකීම් ඉටුකිරීමටද ප්‍රමාණවත්ද යන්න සලකා බැලීමයි. අධ්‍යයනයේ අරමුණ බවට පත්ව ඇත්තේ නිලබල ක්‍රමය සංවර්ධන වගකීම් ඉටු කිරීමට සකස් කර ගත හැක්කේ කෙසේද, යන්නයි. මෙම ගැටළුව විග්‍රහ කර බැලීම සඳහා උපන්‍යාස තුනක් මත පදනම් කර ගෙන ඇත. එනම් දේශපාලන මැදිහත් වීම මගින් නිලබල ක්‍රමය සංවර්ධන වගකීමට සම්බන්ධ කළ හැකි බව, විශේෂඥ දැනුම හා ශිල්පීය හැකියාව තුලින් නිලබල ක්‍රමය සංවර්ධන වගකීම් සම්බන්ධ කළ හැකි බව, නිලබල ක්‍රමය විමධ්‍යගතකරණය කිරීම තුළින් සංවර්ධන වගකීම් වඩාත් හොඳින් කාර්යක්‍ෂමතාවයෙන් ඉටුකරගත හැකි බව යනාදියයි. මෙම උපන්‍යාස අත්හදා බැලීම සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් මහනුවර ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා එහි සේවා සම්පාදනය තෝරා ගෙන ඇත. මහනුවර ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය, ප්‍රාදේශිය කාර්යාල තුනක්, ඒවාට අයත් ගොවි සංවිධාන තුනක්, කුඩා කණ්ඩායම් තුනක් හා අහඹු ලෙස තෝරාගත් ගොවිමහතුන්ගෙන් තොරතුරු ලබාගන්නා ලදි. දත්ත රැස්කිරීමේ දී ප්‍රාථමික හා ද්විතියික දත්ත ආශ්‍රයෙන් සිදු කොට ඇත. ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී ප්‍රශ්නමාලා ක්‍රමය, ව්‍යූහාත්මක නොවන සම්මුඛ සාකච්ඡා, නිරීක්‍ෂනය යොදා ගෙන ඇත. ද්විතියික දත්ත වශයෙන් ග්‍රන්ථ, පුවත්පත්, චක්‍රලේඛ, දෙපාර්තමේන්තු ලිපි ලේඛන ආශ්‍රය කරගෙන දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මකව සිදුකරන ලදි. උපකල්පන මත පදනම්ව දත්ත විශ්ලේෂණය කොට අවසාන නිගමන වලට පැමිණ ඇත. ඒ අනුව දෙපාර්තමේන්තුව තුළ දේශපාලන මැදිහත් වීමට වඩා දේශපාලන අත පෙවීම් සිදු වී ඇති බවත්, විමධ්‍යගතකරණය ආයතන මට්ටමින් සිදුකර ඇති නමුත් සැබැලෙස සංවර්ධන අරමුණු ලගාකර ගැනීමට හැකි විමධ්‍යගතකරණයක් සිදු වී නොමැති බවත්, විශේෂඥ දැණුම හා ශිල්පීය හැකියාව අවම මට්ටමක පවතින බවත් සොයා ගන්නා ලදි. උපකල්පනයන්ට අමතරව සංවිධාන ව්‍යූහයේ දෝෂයන් සංවර්ධන අරමුණු ලගාකර ගැනීමට බාධා කර ඇති බව දැකගත හැකිය. ජනතාවට වගකියන ප්‍රතිචාරාත්මක පරිපාලනයක් උදෙසා දේශපාලන මැදිහත් වීම්, නිසි විමධ්‍යගතකරණයක්, ශිල්පීය හැකියාව හා විශේෂඥ දැනුම හා ශිල්පීය හැකියාව ද අවශ්‍ය වේ. ඒ අනුව සාම්ප්‍රදායික රාජ්‍ය පරිපාලනයෙන් බැහැරව රාජ්‍ය කළමනාකරණයක් දක්වා පරිපාලන ව්‍යූහය ප්‍රතිසංවිධානය කළ යුතුය.